# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2191/42 - 2020 සැප්තැම්බර් මස 04 වැනි සිකුරාදා - 2020.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/COM/01/2018/151.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.09.17 දිනැති හා අංක 2141/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.20 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කඩවත, නුගේගොඩ, මහර, උද්‍යාන මාවත, අංක 37/1 හි පදිංචි, එන්. වී. එෆ්. කොරයා මයා සහ කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.07.29 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 අගෝස්තු මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාවේ දී ය

බේරුම්කරු - ඔබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දී ය

එන්. ටී. එෆ්. කොරයා,
අංක 37/1, උද්‍යාන මාවත,
මහර, නුගේගොඩ,
කඩවත

*පළමු පාර්ශවය*

ආරාවුල් අංකය :
IR/COM/01/2018/151.
බේරුම්කරණ අංකය :
A/93/2019

සහ

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 609,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

*දෙවැනි පාර්ශවය*

2020 ජූලි මස 29 වැනි දින දී ය.

පෙනී සිටීම -

පළමු පාර්ශවය වෙනුවෙන් - නියෝජිත ජී. ඩබ්. ශ්‍රේෂන් ද සිල්වා.

දෙවැනි පාර්ශවය වෙනුවෙන් - නීති නිලධාරිණී දිල්රුක්ෂි ගුණසේකර සමග මානව සම්පත් කළමණාකරු ප්‍රියන්ත වැලිකල සමග රජයේ නීතිඥ නයනතාරා බාල පටබැඳි.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ

"ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආරක්ෂක සහකාර තනතුරේ සේවය කළ එන්. වී. එෆ්. කොරයා මහතා වැඩ තහනමට ලක්ව සිටි කාලය වන 2005.03.17 සිට 2007.08.20 වැනි දින දක්වා කාලය සඳහා හිඟ වැටුප්, වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා ඇතුළු වෙනත් හිමිකමක් තිබේ නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනය කුමක්ද? යන්න පිළිබඳව වේ."

මෙම ආරාවුල සම්බන්ධයෙන් පළමු හා දෙවන පාර්ශවයන් විසින් සිය පළමු හා දෙවැනි ප්‍රකාශ ඉදිරිපත් කරන ලද අතර, දෙවැනි පාර්ශවය විසින් සිය පළමු ප්‍රකාශය මගින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් සාධාරණ කාලයක් තුළ මෙම ඉල්ලීම පළමු පාර්ශවය විසින් සිදුකර නොමැති නිසා මෙම බේරුම්කරණ නඩුව විමසා ප්‍රදානයක් සිදු කිරීමට ගරු බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බවට කරුණු ඉදිරිපත් කර ඇත. පළමු පාර්ශවය විසින් එම මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමින් තම ස්ථාවරය දක්වා ඇත්තේ මෙම ආරවුල බේරුම්කරණය කිරීමේ අධිකරණ බලය ගරු බේරුම්කරු වෙත ඇති බවටයි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ලිඛිත දේශණ ලබා දෙන ලෙසට දෙපාර්ශවයම වෙත දැනුම දීමෙන් අනතුරුව දෙපාර්ශවය විසින්ම සිය ලිඛිත දේශණ මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශවයේ සේවකයා වැඩ තහනමට ලක්ව ඇත්තේ 2005.03.17 සිට 2007.08.20 දක්වා කාලය තුළදී වන අතර, 2007.09.05 වැනි දින සිට නැවත සේවයේ පිහිටුවා ඇත. පළමු පාර්ශවය විසින් සිය ස්ථාවරය දක්වා සිටිමින් කියා සිටින්නේ තමන් 2005.03.17 වැනි දින සිට 2007.08.20 දක්වා වැටුප රහිතව සේවය අත්හිටුවා විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව මුතුරාජවෙල තෙල් ටැංකි සංකීර්ණය වෙත ස්ථාන මාරුකරන බවට වූ කොන්දේසියක් මත නැවත සේවයේ පිහිටුවා ඇති බවත්, තමන් තමන්ගේ සේවය අත්හිටුවා තිබූ කාලයට අදාළ වැටුප් හා දීමනා ගෙවන ලෙසට 2007.11.15 වැනි දින දෙවැනි පාර්ශවයෙන් ඉල්ලුම්කල ද ප්‍රතිචාරයක් නොවූයෙන් 2008.03.28 වැනි දින දරන ලිපිය මගින් ද තමාට හිමි වැටුප් හා දීමනා ගෙවන ලෙසට ඉල්ලීම් කළ බවයි. ඊටද කිසිදු ප්‍රතිචාරයක් නොවූයෙන් නැවත 2012.02.10 වැනි දින දරන ලිපිය මගින්ද එසේ සේවය අත්හිටුවා තිබූ කාලයට හිමි වැටුප් හා දීමනා ගෙවන ලෙසට ඉල්ලීම් කළ බව දක්වා ඇත. ඉන් අනතුරුව පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් කම්කරු දෙපාර්තමේන්තුවට තම පැමිණිල්ල ඉදිරිපත් කළ දිනය පිළිබඳව කිසිදු අවස්ථාවක දක්වා නොමැති අතර, දෙවැනි පාර්ශවය විසින් එසේ පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් සිය පැමිණිල්ල කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත්තේ 2017.08.16 බව දක්වා ඇති අතර පළමු පාර්ශවය විසින් එය කිසිදු අවස්ථාවක ප්‍රතික්ෂේප කර නොමැත. තවද මෙම පළමු පාර්ශවයේ සේවකයා කිසිදු අවස්ථාවක තමන් වෙත ලබා දුන් විනය දඬුවම වන ස්ථාන මාරුව සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් හෝ ඇපැලක් ඉදිරිපත් කල බවට කිසිදු තොරතුරක් ඉදිරිපත් නොවූ පසුබිමක එවන් ඇපැලක් හෝ විරෝධතාවයක් පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් සිදුකර නොමැති බවට ද තීරණය කරමි.

මෙම සේවකයා 2013.01.22 වැනි දින සේවයෙන් විශ්‍රාම ගොස් අති බව දෙවැනි පාර්ශවයේ 2 වන ප්‍රකාශය මගින් දක්වා ඇතත් පළමු පාර්ශවය තම කිසිදු ප්‍රකාශයකින් හෝ ලිඛිත දේශණ මගින් තමන් විශ්‍රාම ලබාගත් දිනය පිළිබඳව කිසිදු සටහනක් ඉදිරිපත් කර නොමැත. ඒ අනුව දෙවැනි පාර්ශවය ඉදිරිපත් කරන ලද සේවයෙන් විශ්‍රාම ගැන්වීමේ දිනය නියමිත දින ලෙස සලකමි.

දෙවැනි පාර්ශවයේ පළමු ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය වන සාධාරණ කාලයක් තුළ මෙම ආරවුල නිසි පරිදි ඉදිරිපත් නොකිරීම මත මෙම නඩුව අසා ප්‍රදානයක් කිරීමට මෙම ගරු බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බව වන විරෝධතාවය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් පළමු පාර්ශවය ඉහළ අධිකරණ නඩු තීරණ කිහිපයක්ම සඳහන් කර ඇතත් එම කිසිදු නඩුවක පිටපතක් ඇමුණුමක් සේ ඉදිරිපත් කර නැති අතර අවම වශයෙන් කිසිදු නඩුවක නඩුවේ හරය සම්බන්ධයෙන් අදාළ කොටස හෝ තම ලිඛිත දේශණයෙහි ඇතුළත් නොකිරීම විශාල අඩුවක් බව පෙනී යයි. පළමු පාර්ශවය විසින් තමන්ට මෙම ආරාවුල සාධාරණ කාලයක් තුළ ඉදිරිපත් කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් කිසිදු සාධාරණ හේතුවක් තම පළමු හා දෙවන ප්‍රකාශ මගින් හෝ සිය ලිඛිත දේශණ මගින් හෝ ඉදිරිපත් කිරීමට නොහැකිවී ඇති බව පෙනී යන අතර, සාධාරණ කාලය පිළිබඳ නිර්ණායකයන් ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමින් එකම නඩු තීන්දුවක් සටහන්කර ඇති බව නිරීක්ෂණය කළ අතර අදාළ නඩුවේදී ප්‍රමාදය සම්බන්ධයෙන් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් වී ඇති බව මනාව පැහැදිලි වන්නේ අදාළ නඩුව කෙරෙහි අවධානය යොමු කිරීමෙනි. මෙම නඩු තීරණය දෙවැනි පාර්ශවය විසින් උපයෝගී කරගෙන ඇත්තේ සාධාරණත්වය පිළිබඳ මූලධර්මය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා බව ද නිරීක්ෂණය කළෙමි. එකී නඩුවේ එනම්,

Biso Menika V. Cyril de Alwis (1982) NLR 368 at 379 නඩුවෙහි පහත කොටස මගින් රිට් ආඥාව සඳහා පෙත්සම ඉදිරිපත්කර ඇත්තේ වසර 3 1/2කට පසුව වුවද ඊට හේතු කාරණා මනාව තහවුරුවී ඇති බව පෙනී යයි.

"The Court of Appeal had considered the proceedings of the Board of Review dated 18.03.78 and has concluded that

the petitioner had abandoned her appeal to the Board. This conclusion cannot be supported. What happened before the Board that day was that when the petitioner's representative was told that since the minister had made the vesting Order under section 17 of the Property Law. The appeal was futile, the representative. Being a layman accepted the untenability of the appeal to the Board. Such acceptance doest not amount to an abandonment of the appeal. From an admission of Law that went to the root of the appeal an abandonment of HE appeal on the ground that the appeal cannot be spelt. The Board of Review however dismissed the appeal on the groung that the appeal had been preferred prior to the intimation by the Commissioner on 3.11.76 of the Minister's order. The proceedings before the Board of Review are relevant to show that the petitioner was pursuing a legal remedy that was open to her and that she was not guilty of unresonable delay in seeking the Writ.''

එහෙත් මෙම ආරවුලට අදාළ පළමු පාර්ශවය කිසිදු අවස්ථාවක තම ප්‍රමාදයට සාධාරණ හේතුවක් ඉදිරිපත් නොකර ඇති බවද නිරීක්ෂණය කලෙමි. මෙම ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවා ඇත්තේ 2007.09.05 වැනි දින වන අතර තමන්ගේ සේවය අත්හිටුවා ඇති කාලය සඳහා වන වැටුප් සම්බන්ධයෙන් 2007.11.15 වැනි දින ලිපියක් ඉදිරිපත් කර ඇති අතර, ඊට ප්‍රතිචාරයක් නොමැතිවීම හේතු කොට ගෙන නැවතත් 2008.03.28 දාතමින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඊටද ප්‍රතිචාරයක් නොමැතිවූ විට ඔහු නැවතත් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් සිදුකර ඇත්තේ වසර 4කට පමණ පසුව බව නිරීක්ෂය විය. එනම් 2012.02.10 වැනි දින බව පෙනේ. එතෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් මෙම සේවකයා ගෙන නොමැති බවද නිරීක්ෂණය විය. ඉන්පසු මෙම සේවකයා 2013.01.22 වැනි දින විශ්‍රාම ගොස් ඇති අතර, ඔහුගේ වැඩ තහනමට ලක්වූ කාලයට අදාළ හිඟ වැටුප් හා දීමනා ලබාදෙන ලෙසට සිය ඉල්ලීම පළමුවරට කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර ඇත්තේ 2017.08.16 වැනි දින බව පෙනී යයි. එනම් විශ්‍රාම යාමෙන්ද වසර 4 1/2කට වඩා වැඩිකාලයක් ඉක්මවා ඇති පසුබිමක බවද පෙනේ. මේ අනුව අවසාන වරට මෙම පළමු පාර්ශවයේ සේවකයා සිය වැඩතහනටම ලක්වූ කාලය තුළ තමාට ලබා නොදුන් වැටුප් සහ දීමනා සම්බන්ධයෙන් දෙවැනි පාර්ශවයේ සේවා යෝජකගෙන් ඉල්ලීම් කර ඇත්තේ 2012.02.10 වැනි දින වන අතර එදිනෙන් පසු මෙම පළමු පාර්ශවයේ සේවකයා විසින් තම ආරවුල පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත්තේ වසර 5 1/2කට වඩා වැඩි කාලයකට පසුව බවද නිරීක්ෂණය කළෙමි.

ආරවුලක් යොමුකර ඇති විටදී එම ආරවුල සජීවී ආරවුලක්ද යන්න පිළිබඳව නිරීක්ෂණය කිරීම ද බේරුම්කරණයේදී ඉතා වැදගත් වේ. ආරවුලක් බේරුම්කරණයට යොමු කිරීම සම්බන්ධයෙන් නිශ්චිත කාල රාමුවක් නොමැති බව මනාව පැහැදිලි නෛතික තත්ත්වයක් බව අවිවාදිත වේ. එහෙත් යම් කිසි ආරවුලක් බේරුම්කරුවකුට යොමු කිරීමේදී එය සජීවී ආරවුලක්ද යන්න පිළිබඳව විමසා බලා කටයුතු කිරීම බේරුම්කරුවකුගේ යුතුකමක් බව ද අවිවාදිත වේ. එයට හේතුව වන්නේ බේරුම්කරුවකු තම ප්‍රදානය කළ යුත්තේ සාධාරණ හා යුක්ති සහගත පදනම මත වන බැවිනි. මේ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශවයේ සිය ලිඛිත දේශණවල දක්වා ඇති නඩු තීන්දු කෙරෙහි ද මාගේ අවධානය යොමු කළෙමි.

"The State Bank of India V. Sundaralingam (1971) 73 NLR 514"

"AZN Grindlays Bank V. Ministry of Labour and Others (1995) 2 Sri L. R. 53"

"CA (writ) Application No. 99/06"

සේවකයා යන්නට සේවයෙන් ඉවත් වූ සේවකයකු ඇතුළත් බව සංශෝධිත 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 48 වැනි වගන්තිය මගින් දක්වා ඇත. එසේ වුවද මෙසේ සේවයෙන් ඉවත්වූ සේවකයකු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඇත්ත වශයෙන්ම සේවාන්න ප්‍රතිලාභ සම්බන්ධ කරුණුවලට පමණක් සීමාවන බව පවතින නීති රාමුව වන බව මනාව පැහැදිලිවේ. මේ සම්බන්ධයෙන් පනතේ 17 (2) වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදන සලකා බැලීමේදී පෙනී යන්නේ බේරුම්කරණ ප්‍රදානයක් සේවකයා හා සේව්‍යා අතර පවත්නා ගිවිසුමෙහි ව්‍යංගිත කොන්දේසි බවට පත්වන බව දක්වා ඇති බවයි. එසේ නම් යම් බේරුම්කරණ ප්‍රධානයක් ලබාදීමේදී සේවකයා හා සේව්‍යා අතර වලංගු සේවා ගිවිසුමක් පැවතිය යුතු බව අවිවාදිත වේ. ඒ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශවය සිය ලිඛිත දේශණවල දක්වා ඇති නඩුව කෙරෙහිද මෙම තීරණය ලබා දීමේදී අවධානය යොමු කලෙමි.

"SC Appeal No. 22/2012"

මෙම බේරුම්කරණය සම්බන්ධයෙන් තවදුරටත් සිය ස්ථාවරය දක්වමින් හා මූලික විරෝධතා සම්බන්ධයෙන් කරුණු දක්වමින් "Delay defeats Equity" යන සිද්ධාන්තය පිළිබඳවත් කරුණු දක්වා ඇත. ඒ අනුව "Bisomenke v. C. R. de Alwis (1982) 1 Sri L. R. 368" නඩුවේදී ගරු විනිසුරු ෂර්වානන්දන් මැතිතුමා විසින් දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම තත්ත්වය පිළිබඳව "Pieris and Another V. Perera and Another (2002) 2 Sri L. R. 128" නඩුවේදී ද ගරු අභියාචනාධිකරණය කරුණු පැහැදිලි කර ඇත.

### ප්‍රදානය

ඒ අනුව දෙපාර්ශවයේ පළමු හා දෙවන ප්‍රකාශ සහ දෙපාර්ශවයේ ලිඛිත දේශණ සලකා බැලීමෙන් අනතුරුව පහත තීරණයට එළැඹියෙමි. ඒ අනුව, දෙවැනි පාර්ශවය විසින් ඉදිරිපත් කරනු ලැබූ මූලික විරෝධතාවයන් දෙකම පිළිගනිමින් මෙම ආරවුල පරික්ෂාකර ප්‍රදානයක් ලබාදීමට අධිකරණ බලය මෙම කාර්මික බේරුම්කරණ

විනිශ්චය සභාවට නොමැති බවට තීරණය කරන අතර, ඉල්ලුම්කාර පළමු පාර්ශවය විසින් සාධාරණ කාලයක් තුළ අයදුම්පත යොමු කිරීමට අසමත්වී ඇතිය යන විරෝධතාවය ද පිළිගනිමි. ඒ අනුව මෙම යොමුකර ඇති ආරවුල සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණයක් පවත්වාගෙන යාමට මෙම බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බැවින් මෙම පරීක්ෂණ කටයුතු මෙයින් අවසන් කරමි.

ඒ අනුව පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙම සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

2020 ජූලි මස 29 වැනි දින,

බේරුම්කරු,
ඔබඩගේ ලීලාරත්න.

09 - 479

---

*මගේ අංක* : IR/COM/01/2017/131,
IR/COM/01/2017/161.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.10.23 දිනැති හා අංක 2094/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.10.11 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් වත්තල, එඬේරමුල්ල, කීල්ස් නිවාස, අංක 163හි පදිංචි එම්. අයි. එම්. රිස්වි මයා ඇතුළු සේවකයින් 51 දෙනා සහ කොළඹ 03, ගාලු පාර, අංක 90, සෙලාන් ටවර් හි පිහිටි සෙලාන් බැන්ක් පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.03.17 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 අගෝස්තු මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාව,
බේරුම්කරු - ඔබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දී ය.

එම්. අයි. එම්. රිස්වි මයා,
අංක 163, කීල්ස් නිවාස,
එඬේරමුල්ල, වත්තල.
(ඇතුළු සේවකයන් 51 දෙනෙක්)

*පළමු පාර්ශවය*

IR/COM/01/2017/131
IR/COM/01/2017/161 සහ
නඩු අංකය : A/73/2018

සෙලාන් බැන්ක් පීඑල්සී,
සෙලාන් ටවර්,
අංක 90, ගාලු පාර,
කොළඹ 03.

*දෙවැනි පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරවුල.

පෙනී සිටීම -

පළමු පාර්ශවය වෙනුවෙන් - නීතිඥ රවී මොල්ලිගොඩ මහතා

දෙවැනි පාර්ශවය වෙනුවෙන් - නීතිඥ අදීල් කාසිම් මහතා

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර මා වෙත යොමුකර ඇත.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"සෙලාන් බැන්ක් පීඑල්සී හි සේවය කරන ලද එම්. අයි. එම්. රිස්වි මහතා ඇතුළු ඇමුණුමේ නම් සඳහන් සේවකයින් 51 දෙනෙකු, වයස අවුරුදු 58 සම්පූර්ණ වීමට ප්‍රථම විශ්‍රාම ගන්වමින් සේවය අවසන් කිරීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ යුක්ති සහගත නොවෙන්නේ නම්, ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ."

ඉහත ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින්ම සිය පළමු ප්‍රකාශ ගොනු කර තිබූ අතර, මෙම පරීක්ෂණය ආරම්භ කරන ලද දිනයේදී දෙපාර්ශවය විසින් සිය දෙවැනි ප්‍රකාශ ද ගොනු කරන ලදී. පළමු පාර්ශවය තම පළමු ප්‍රකාශයෙන් කරුණු දක්වමින් ඇමුණුම

"A" මගින් දක්වා ඇති සේවකයින් 51 දෙනෙකු එම ලේඛනයේ සඳහන් කර ඇති ආකාරයට පත්වීම් ලැබ දෙවැනි පාර්ශවය වන සෙලාන් බැන්ක් පීඑල්සී ආයතනයේ සේවය කල බවත්, වයස අවුරුදු 58 දක්වා සේවය කිරීමට සියලුම සේවකයන්ට හැකි බවට නිකුත් කරන ලද SCL 2008/43 හා 2008 සැප්තැම්බර් මස 19 දිනැති චක්‍රලේඛය පදනම් කරගනිමින් තමන්ට වයස අවුරුදු 58 දක්වා සේවය කිරීමට හැකි බව සාධාරණ බලාපොරොත්තුවක් සහ අපේක්ෂාවක් තිබූ බවත්, එහෙත් අත්තනෝමතිකව හා නීතිවිරෝධීව ඒකපාර්ශිකව වගඋත්තරකාර ආයතනය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක SCL 2009/003 හා 2009 මාර්තු මස 19 දිනැති චක්‍රලේඛය පදනම් කරගනිමින් අයුක්ති සහගත සහ අසාධාරණ ලෙස තමන්ට වයස අවුරුදු 58 තෙක් සේවය කිරීමට අවස්ථාව ලබා නොදී ඇමුණුම "A" හි 3 වන තීරුවේ සඳහන් කාලවලදී තම සේවය අවසන් කරන ලද බවත්, එබැවින් එකී ඇමුණුමෙහි 7 වන තීරුවේ සඳහන් මුදල තමන්ට ලබා දෙන ලෙසට නියම කරන ලෙසටත් ඉල්ලා සිටී.

දෙවැනි පාර්ශවය සිය පළමු ප්‍රකාශය ගොනුකරමින් මූලික විරෝධතාවයක් මතුකරමින් දක්වා ඇත්තේ පළමු පාර්ශවයට මෙම බේරුම්කරණ නඩුව පවත්වාගෙන යාමට නොහැකි බවත් මෙය කාර්මික ආරවුල් පනතේ සඳහන් කාර්මික ආරවුලක් ගණයට අයත් නොවන බවත් " State Bank of India Vs. Sundaralingam 73 NLR 514" යන නඩු තීන්දුවට අනුව සේව්‍යා සහ සේවයෙන් ඉවත් වූ සේවකයන් අතර කාර්මික ආරවුලක් නොපවතින බැවින් කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පත්කරන ලද බේරුම්කරුට මෙම ආරවුල විභාග කිරීම සඳහා අධිකරණ බලයක් නොමැති බවට කරුණු දක්වා ඇත. තවදුරටත් කරුණු දක්වමින් පවසා සිටින්නේ 2008 සැප්තැම්බර් මස 19 වැනි දින නිකුත් කරන ලද SCL 2008/43 චක්‍රලේඛය පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන්ට නිකුත්කර ඇති පත්වීම් ලිපියෙහි විශ්‍රාම වයස සම්බන්ධයෙන් කෙලින්ම බලපාන බවත්, ඒ අනුව වගඋත්තරකාර බැංකුව එම චක්‍රලේඛය SCL 2009/003 හා 2009 මාර්තු මස 19 චක්‍රලේඛය මගින් අවලංගු කරමින් විශ්‍රාම වයස අවුරුදු 58 සිට අවුරුදු 55 දක්වා අඩු කළ බවත්ය. තවදුරටත් කරුණු දක්වමින් පවසා සිටින්නේ මෙම පළමු පාර්ශවයේ සේවකයන් සේවයට බැඳුනේ සහ විශ්‍රාම ගන්වනු ලබන්නේ සේවයට බැඳීමේ දී ලබා දුන් පත්වීම් ලිපියේ 13 වැනි ඡේදයට අනුකූලව බවයි. මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු දක්වමින් පවසා සිටින්නේ පළමු පාර්ශවයට ගත යුතුව තිබූ නෛතික සහනයක් වන්නේ කම්කරු විනිශ්චය සභාවට හෝ සේවය අවසන් කිරීමේ අංශය වෙත අයදුම්පතක් යොමු කිරීම බවත්, මාස 6ක් තුළ තම ඉල්ලුම්පත් අදාළ අංශය වෙත යොමු කිරීමට අපොහොසත්වීම මගහරවා ගැනීමේ අභිලාෂයෙන් මෙම බේරුම්කරණ නඩුව ගොනු කර ඇති බවත්ය. ඒ අනුව මෙම නඩුව මෙතැයින්ම අවසන් කරන ලෙසට ඉල්ලීම් කර ඇත. එහෙත් කිසිදු අවස්ථාවක පළමු පාර්ශවය විසින් කරුණු දක්වා ඇති චක්‍රලේඛ ප්‍රතික්ෂේප කිරීමක් දෙවැනි පාර්ශවය විසින් සිදුකර නොමැති බවද මෙහිදී සැලකිල්ලට ගත යුතුව ඇත.

පළමු පාර්ශවය විසින් දෙවැනි පාර්ශවයේ පළමු ප්‍රකාශයට පිළිතුරු සපයමින් එහි විශේෂයෙන්ම පිළිගන්නා කරුණු හැර අනික් සියලු කරුණු ප්‍රතික්ෂේප කර ඇත. මෙහිදි විශේෂයෙන්ම දෙවැනි පාර්ශවයේ පිළිතුරු ප්‍රකාශයේ 3 වැනි ඡේදය ප්‍රතික්ෂේප කරමින් එහි දක්වා ඇති නඩු තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීරණයක් වන "S. B. Perera Vs. Standard Chartered Bank and Others (1995) 1 SLR 73" මගින් යටපත් කර ඇති බවත් ඒ අනුව එකී කරුණ ප්‍රතික්ෂේප වන බවත් ය. තව ද, සේවකයන් විසින් අරගල කර ලබාගත් අවුරුදු 58 දක්වා සේවය කිරීමේ අවස්ථාව ඒකපාර්ශිකව වෙනස් කරමින් එම වයස් සීමාව අවුරුදු 55 දක්වා පහත හෙලීම නීති විරෝධි වන අතර එය නීතිය ඉදිරියේ බලරහිත එකක් බවයි.

දෙවැනි පාර්ශවය විසින් ගොනුකර ඇති දෙවැනි ප්‍රකාශය මගින් තම පළමු ප්‍රකාශයේ කරුණු නැවතත් තහවුරු කර ඇති අතර පළමු පාර්ශවයේ ඉල්ලා ඇති ඉල්ලීම් ලබා ගැනීමට ඔවුන් හිමිකමක් නොලබන බවට කරුණු දක්වා ඇත.

මෙහිදී පළමු පාර්ශවය විසින් සමථ යෝජනාවක් ඉදිරිපත් කරමින් තමන් පළමු ප්‍රකාශයට ඇමුණුමක් ලෙස එකතු කරන ලද "A " ඇමුණුමෙහි ඉල්ලා ඇති අංක 1 සිට 7 දක්වා ඉල්ලීම් අතරින් අංක 1 සහ 2 පමණක් ලබා දෙන්නේ නම් මෙම ආරවුල සමථයකට පත් කර ගැනීමට තමන් සූදනම් බවයි. මේ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශවය කරුණු දක්වමින් පවසා සිටියේ මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කොට ප්‍රතියෝජනාවක් ඇත්නම් ඉදිරිපත් කරන බවත් එසේ නොවන්නේ නම් මෙම බේරුම්කරණ නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසටත් ය. කෙසේ වුවද සමථයක් නොවූයෙන් මෙම බේරුම්කරණ නඩුවේ සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී.

මෙම බේරුම්කරණ නඩුවේදී පළමු පාර්ශවය සහ දෙවැනි පාර්ශවය විසින් පිළිගන්නා ලද කරුණු අතර, පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපිවල 13 වැනි ඡේදය අනුව විශ්‍රාම වයස අවුරුදු 55 බවත්, 2008 වර්ෂයේදී විශ්‍රාම යන වසය අවුරුදු 58 දක්වා වැඩිකල බවත්, නැවත 2009 වර්ෂයේදී විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 දක්වා අඩුකිරීමට දෙවැනි පාර්ශවය තීරණය කල බවත් යන කරුණු වේ.

ප්‍රථමයෙන්ම පළමු පාර්ශවය විසින් සාක්ෂියට කැඳ වූ ජයකොඩි ආරච්චිගේ අජිත් රෝහන මහතා මගින් 2001 මාර්තු මස 13 දිනෙන් යුතුව නිකුත් කරන ලද අංක 2001/10 දරන විශ්‍රාම ගැන්වීම යන ශීර්ෂය යටතේ වූ චක්‍රලේඛය "ඉ 1" ලෙස සලකුණු කරන ලද අතර, දෙවැනි පාර්ශවය විසින් එම චක්‍රලේඛය "X2" ලෙස සලකුණු කර ඇත. ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපිවල 13 වන ඡේදයෙහි සඳහන් විශ්‍රාම යාමේ වයස ඒ මගින් සංශෝධනය කර ඇත. එම චක්‍රලේඛයට අනුව "Accordingly, the Retirement Clause No. 13 in the letter of appointment to be treated as amended" ලෙසට පත්වීම් ලිපිවල සඳහන් 13 වැනි ඡේදය සංශෝධනය වී ඇති බව තහවුරු කර ඇත. මෙම චක්‍රලේඛය මගින් විශ්‍රාම යාමේ වයස අවුරුදු 55න් පසුව වාර්ෂිකව සේවා දීර්ඝ කිරීම් මත අවුරුදු 60 දක්වා සේවය කිරීමට හැකි බව දක්වා ඇති අතර, එසේ සේවා දිගු ලබාදීම හුදෙක් දෙවැනි පාර්ශවය වන බැංකුවේ අභිමතය මත සිදුවන බව අවධාරණය කර ඇත.

දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් නැවතත් 2008 සැප්තැම්බර් මස 19 දිනෙන් යුතුව අංක SCL 2008/043 චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර එමගින් විශ්‍රාම වයස සෑම සේවකයකු සම්බන්ධයෙන්ම අවුරුදු 55 සිට 58 දක්වා ඉහළ දමා ඇත. එම චක්‍රලේඛය "ඉ2" ලෙස පළමු පාර්ශවයේ පළමු සාක්ෂිකරු මගින් සලකුණු කර ඇති අතර, ඒම ලේඛණය "X3" ලෙසට දෙවැනි පාර්ශවය විසින් සලකුණු කර ඇත. කෙසේ වුවද මෙම චක්‍රලේඛය මගින් හෝ වෙනත් ආකාරයකින් ඉහත 2001/10 චක්‍රලේඛය අවලංගු කල බවට සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති අර ඒ අනුව "ඉ2" චක්‍රලේඛයට අනුව වසය අවුරුදු 58න් පසු වසර 60 දක්වා සේවා දිගුවක් ඉල්ලීම් කිරීමට ඇති අයිතිය අහිමි කර ඇද්දැයි නිශ්චිතව සඳහන් කර නොමැත.

ඉහත චක්‍රලේඛය නිකුත් කර මාස 6ක් ඉක්මවා යාමත් සමගම නැවතත් අංක SCL 2009/003 චක්‍රලේඛය මගින් විශ්‍රාම වයස අවුරුදු 58 සිට 55 දක්වා වෙනස් කර ඇත. පළමු පාර්ශවය විසින් මෙම චක්‍රලේඛය "ඉ3" ලෙසට ද දෙවැනි පාර්ශවය විසින් "X4" ලෙසට ද සලකුණු කර ඇත. මෙම චක්‍රලේඛයේ a, b, c වශයෙන් කොටස් තුනක් ඇති අතර පළමු පාර්ශවය විසින් එම කොටස් තුනෙන් මුල් 2 "ඉ3a" සහ "ඉ3b" ලෙස සලකුණු කර ඇත. එකී කොටස් 3 පහත පරිදි වේ.

(a) implement the Public Administration Circular and set the retirement age at 55 years.
මෙයින් අදහස් කර ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ක්‍රියාත්මක කරමින් විශ්‍රාම වයස අවුරුදු 55 ලෙසට පහත හෙලූ බවයි.

(b) If any staff member applies for an extension, the Management to evaluate his/her performance and grant extensions annually until he/she reaches the age of 57 years at the discretion of the Management.
මෙයින් අදහස් කරනු ලබන්නේ කිසියම් සේවකයකු සේවා දිගුවක් ඉල්ලා සිටින්නේ නම් කළමණාකාරිත්වය විසින් ඔහු/ඇය සම්බන්ධයෙන් කරනු ලබන ඇගයීමක් මත වාර්ෂිකව අවුරුදු 57 දක්වා සේවා දිදු ලබා දෙන බවයි.

(c) Only in and event where the Management decides that the services of a highly skilled employee who could not be easily replaced and who will contribute to the botton line directly, such an employee could be exceptionally granted and extension annually until he/she reaches the age of 60 years. However, this practice is not to be encouraged
මේ යටතේ දක්වා ඇත්තේ ඉහල නිපුණත්වයක් ඇති සේවකයෙකු එනම් පහසුවෙන් එවැන්නකු පත්කර ගැනීමට නොහැකි බවට කළමණාකාරිත්වය තීරණය කරන අවස්ථාවකදී ඔහුට/ඇයට වාර්ෂිකව සේවා දිගුවක් අවුරුදු 60 දක්වා ලබා දීමට තීරණය කර ඇති බවයි.

තවද ඉහත චක්‍ර ලේඛය මගින් අංක SCL 2008/043 වන "x3" දරන චක්‍රලේඛය අවලංගු කරන බව ද සඳහන් කර ඇත.

පළමු පාර්ශවය සහ දෙවැනි පාර්ශවය යන පාර්ශව දෙකම කිසිදු හබ කිරීමකින් තොරව ඉහත සඳහන් චක්‍රලේඛ දෙවන පාර්ශවය විසින් නිකුත් කර ඇති බව පමණක් පිළිගෙන ඇත.

මෙම බේරුම්කරණ නඩුවේ පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් 51 දෙනා අතරින් මෙම නඩුවෙන් ඉල්ලා අස් වූ, ලේඛනයේ අංක 8 නම සඳහන් එම්. ඒ. එස්. සී. පෙරේරා සහ අංක 44 නම් සඳහන් එම්. ඒ. ඩබ්. ආර්. ජයවර්ධන යන දෙදෙනා සහ මියගොස් ඇති අංක 22 යටතේ දක්වා ඇති ආර්. එන්. ආර්. නාගහවත්ත යන තිදෙනා හැරුන විට ඉතිරි 48 දෙනාම වයස අවුරුදු 55ත් 57 අතර කාලය තුළ විශ්‍රාම ගත්වා ඇත. ඒ පිළිබඳව දෙපාර්ශවය විසින්ම එකතුව ඉදිරිපත් කරන ලද "Z" ලේඛනයෙන් පිළිගෙන ඇත. මෙම විශ්‍රාම ගැන්වීම සිදුකර ඇත්තේ 2009/003 දරන චක්‍රලේඛය අනුව බව පෙනී යන කරුණකි.

මෙම් බේරුම්කරණ නඩුවේ පළමු පාර්ශවයේ ස්ථාවරය වී ඇත්තේ ඔවුන් ඉහත ලේඛණයේ සඳහන් වයසේදී එනම් අවුරුදු 55 ත් 57ත් අතර කාලයේදී විශ්‍රාම ගැන්වීම අයුක්ති සහගත, අසාධාරණ සහ නීතියට පටහැනි බවත් තමන්ට වයස අවුරුදු 58 දක්වා සේවය කිරීමට නීත්‍යානුකූල අපේක්ෂාවක් සහ බලාපොරොත්තුවක් තිබූ බවත්, තමන්ට එසේ කිරීමට සාධාරන අයිතියක් තිබූ බවත් වේ. ඒ අනුව තමන්ගේ සේවය අයුක්ති සහගත සහ අසාධාරණ ලෙස අවසන් කිරීම නීතියට පටහැනි බවත්ය.

තව ද, පළමු පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් අජිත් පෙරේරා මහතා විසින් තමන්ගේ සේවය අවුරුදු 55 සම්පූර්ණ වීම නිසා අවසන් කරන බවට වූ දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් ඔහු වෙත යොමුකරන ලද ලිපිය "ඉ 4" ලෙස ද, වසරක සේවා දිගුවක් ඔහු වෙත ලබා දෙමින් යොමු කරන ලද ලිපිය "ඉ 5" ලෙසද, සලකුණු කර ඇති අතර, නැවත සේවා දිගුවක් ඉල්ලා සිටිමින් ඊට හේතු දක්වමින් සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිය "ඉ 6" ලෙසටද සලකුණු කර යාකර ඇත. තවද, බැංකුව විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් සාක්ෂිකරු වෙත යොමුකරන ලද ලිපිය "ඉ 7" ලෙසට සලකුණු කරමින් ගොනුකර ඇත. තවද, සාක්ෂිකරු වෙත දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් නිකුත් කරන ලද සේවා සහතිකයද, "ඉ 8" ලෙස සලකුණු කර ඇත. ඉන් අනතුරුව සාක්ෂිකරු විසින් කම්කරු කොමසාරිස්වරයාට තමාගේ සේවය නියමිත කාලයට පෙර අවසන් කිරීම සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ල "ඉ 9" ලෙසට සලකුණු කර ඇත. තවදුරටත් සාක්ෂි ලබා දෙමින් තම වෘත්තීය සමිතිය වන සෙලාන් බැංකු සේවකයන්ගේ වෘත්තීය සමිතියේ සභාපතිවරයා විසින් දෙවැනි පාර්ශවය වන බැංකුව වෙත 2009/003 දරන චක්‍රලේඛයට එරෙහිව කරුණු දක්වා ඇත. එමගින් කරුණු දක්වමින් සේවකයන් වයස අවුරුදු 58 විශ්‍රාම වයස පදනම් කරගනිමින් බැංකුවෙන් ණය මුදල් ආදිය ලබාගෙන ඇති බවත් දක්වා ඇත. තවද, පළමු පාර්ශවය විසින් සාක්ෂි ලබා දුන් කේ. එන්. ද සිල්වා මහතා විසින් සේවා දිගුවක් ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපිය "ඉ 14" ලෙස සළකුණු කර ඇති අතර එය ප්‍රතික්ෂේප කරමින් දෙවැනි පාර්ශවයේ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය "ඉ 15" ලෙසද සළකුණු කර ඇත. මෙම

ඉල්ලුම්කාර සේවකයන් තමන් විසින් දෙවැනි පාර්ශවයේ බැංකුව වෙතින් සේවා දිගු සඳහා ඉල්ලීම් කරන ලද හා බැංකුව විසින් ඊට දක්වන ලද ප්‍රතිචාර සම්බන්ධයෙන් 1a, 1b, 2a, 2b ආදී ලෙසට සළකුණු කර ඉල්ලුම්කරුවන් 48 දෙනා අතරින් 32 දෙනෙකු විසින් ලේඛන ඉදිරිපත් කර ඇත.

මෙම සේවකයන්ගෙන් බොහොමයකගේ සේවය අවසන් කර ඇත්තේ ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි 13 ඡේදය අනුව බවත් සමහර සේවකයන්ගේ සේවය අවසන් කර ඇත්තේ 2009/003 දරන චක්‍රලේඛය පදනම් කරගෙන බවත් මෙම ලිපි පිළිබඳව පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන කරුණකි. මේ අනුව පැහැදිලි වන කරුණ වන්නේ දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් මෙම බොහෝ සේවකයන්ගේ සේවය අවසන් කර ඇත්තේ 2009/003 දරන චක්‍රලේඛය මත පදනම්ව නොව එම සේවකයන්ගේ පත්වීම් ලිපිවල සඳහන් 13 වන ඡේදය මත බව පැහැදිලිව පෙනියන කරුණකි. එහෙත් මෙම පත්වීම් ලිපිවල ඇති 13 ඡේදය SCL 2001/10, SCL 2008/043 සහ SCL 2009/003 මගින් සංශෝධනය වී ඇති බව පැහැදිලි වේ. අනික් අතට මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කරන විට ක්‍රියාත්මක වී ඇති චක්‍රලේඛය "ඉ 3", "X4" වන අතර එම චක්‍රලේඛයට අනුව විශ්‍රාම යන වයස අවුරුදු 55 වුවද අවුරුදු 57 දක්වා සේවා දිගුවක් ඉල්ලීමේ අයිතිය සේවකයන්ට තිබෙන බව මනාව පැහැදිලි වේ. එහිදී එසේ සේවා දිගුවක් ලබාදීමේ පූර්ණ අධිකාරිය දෙවැනි පාර්ශවයේ බැංකුව වෙත ලබාදී ඇතත් එම චක්‍රලේඛයේ b කොටසින් මෙසේ දක්වා ඇත.

(b) If any staff member applies for an extension, the Management to evaluate his/her performance and grant extensions annually until he/she reaches the age of 57 years at the discretion of the Management.

ලෙසට දක්වා තිබුණ ද මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් කිසිවකු සම්බන්ධයෙන් ඉල්ලීම් පිළිබඳව සලකා බැලීමේදී කිසිදු ආකාරයකට සේවා ඇගයීමක් සිදුකළ බවට කරුණු ඉදිරිපත් වී නොමැත. තවද, මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් නඩු තීරණයක් කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කිරීම ඉතා වැදගත් වන අතර, එම නඩු තීරණය පළමු පාර්ශ්වය විසින් තම ලිඛිත දේශන සමග ඇමුණුමක් ලෙසට ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එනම්,

AMERASINGHE VS. BOARD OF DIRECTORS, CO-OPERATIVE WHOLESALE ESTABLISHMENT AND OTHERS (1998) 1 SLR 367 නඩු තීරණයට අනුව පෙන්වා දී ඇත්තේ,

"Even though the petitioner cannot claim as of right an extension of service beyond 55 years and the extension is a matter of discretion, once he makes an application, he is entitled to have his application properly, duly and fairly considered by he relevant authority".

ඒ අනුව සලකා බැලීමේදී දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන්ගේ සේවා දීර්ඝයන් නියමාකාරයෙන් තමන් විසින්ම නිකුත් කරන ලද SCL 2009/003 චක්‍රලේඛයට අනුව වත් සලකා බලා නොමැති බව මනාව පැහැදිලි වේ. එහෙත් දෙවැනි පාර්ශවය විසින් සලකුණු කර ඉදිරිපත් කරන ලද "X6" ලේඛනයට අනුව මෙම චක්‍රලේඛය නිකුත් කරන අවස්ථාව වන විට සේවා දිගු ලබා ඇති සේවකයන් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව කරුණු මෙමෝ පත්‍රයක් මගින් දක්වා ඇති අතර, එමගින් දක්වා ඇත්තේ ඒ වන විට 55 ඉක්මවා සිටින සේවකයින් අවුරුදු 56 දී විශ්‍රාම ගත යුතු බවත්, අවුරුද 56 ඉක්මවා සේවය කරන සේවකයින් අවුරුදු 57 වන විට විශ්‍රාම ගතයුතු බවත්, අවුරුදු 57 ඉක්මවා සේවයේ යෙදෙමින් සිටින සේවකයින් වයස අවුරුදු 58 සම්පූර්ණ වීමෙන් විශ්‍රාම ගන්වන බවත් වේ. මෙම මෙමෝ පත්‍රය "ඉ 19" හා "X6" ලෙස පළමු හා දෙවැනි පාර්ශව විසින් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම් බේරුම්කරණ නඩුවේදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව අදළ ඉල්ලුම්කරුවන් අතරින් "Z" ලේඛනයෙහි නම් සඳහන් අංක 5, 6, 7, 9, 19, 24, 26, 29, 30, 34, 35, 40, 41, 46, 50, 51 යන සේවකයන්ගේ ඉල්ලීම් ලිපි හෝ බැංකුව විසින් සේවා දීර්ඝය ප්‍රතික්ෂේප කරමින් විශ්‍රාම ගැන්වූ ලිපි ඉදිරිපත් වී නොතිබුණ ද ඒ සම්බන්ධයෙන් "ඉ 16ඒ" ලේඛනයේ " E 16.1" ලෙස සඳහන් තීරුවෙහි ඇති තොරතුරු හා පළමු පාර්ශවයේ සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු විසින් ලබා දෙන ලද සාක්ෂිවලට අනුව හා ඉදිරිපත් වී තිබූ ඉල්ලීම් ලිපි හා විශ්‍රාම ගැන්වීමේ ලිපි හා ප්‍රතික්ෂේප කිරීම් ලිපි මගින් පැහැදිලි වන්නේ මෙම සියලුම ඉල්ලුම්කරුවන්ගේ සේවය දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් අවසන් කර ඇත්තේ ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් 13 වෙනි ඡේදයේ විශ්‍රාම යාමේ වයස සහ 2009/003 දරන චක්‍රලේඛවල ප්‍රතිපාදනයට අනුව බවයි.

මෙසේ පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් විශ්‍රාම ගැන්වීමේදී පදනම් කරගෙන ඇත්තේ ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි 13 වැනි ඡේදය හා 2009/003 චක්‍රලේඛය වන අතර, ඉහතින් සඳහන් කරන ලද චක්‍රලේඛ මගින් එම 13 වැනි ඡේදය අවස්ථා තුනකදී සංශෝධනය වී ඇති බව නොසලකා හරිමින් කටයුතු කර ඇති බවද පැහැදිලි වන කරුණකි. මෙහිදී දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් 2009/003 දරන චක්‍රලේඛය සංශෝධනයට හේතු වූ කරුණු ලෙස බැංකුව එවකට මුහුණ පෑ මූල්‍ය අර්බුදය හේතු වූ බවට කරුණු ගෙනහැර දක්වමින් "X5" ලෙසට බැංකුව විසින් නිකුත් කර තිබූ සිද්ධි අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් පළමු පාර්ශවය විසින් තම ස්ථාවරය දක්වමින් එම සිද්ධි අධ්‍යයන වාර්තාවේ 163 පිටුව "ඉ 18" ලෙසද, 197 පිටුව "ඉ 19" ලෙසද, 57 පිටුව "ඉ 20" ලෙස ද, 165 පිටුව "ඉ 21" ලෙසද, "X5" සම්බන්ධයෙන් එවකට මහ බැංකු අධිපති ලෙස කටයුතු කරන ලද අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් දිවයින පුවත් පතට ලබාදී ඇති ප්‍රකාශයක් සම්බන්ධ වාර්තාවද අමුණා ඉදිරිපත් කර ඇත. මෙහිදී පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන හා ලබාදී ඇති සාක්ෂි අනුව දෙවැනි පාර්ශවය වන බැංකුව දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී නොමැති බව තහවුරු කර ඇත. තව ද පැවති තත්ත්වය 2010 වන විට සමනය වී ඇති බවටත් කරුණු ඉදිරිපත් කර ඇත.

දෙවැනි පාර්ශවය වෙනුවෙන් සාක්ෂිකරුවන් දෙදෙනෙකු කැඳවා තිබූ අතර එම සාක්ෂිකරුවන්ගෙන් තහවුරු කිරීමට උත්සාහ කරන ලද්දේ විශ්‍රාම වයස අවුරුදු 55 බවත්, එය 2009/003 චක්‍රලේඛය අනුව බවත් හා ඊට අමතරව, මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් විශ්‍රාම ගන්වා ඇත්තේ ඔවුන්ගේ පත්වීම් ලිපියේ 13 වැනි ඡේදයට අනුව බවත් වේ. තවදුරටත් 2009 වර්ෂය වන විට මූල්‍ය අර්බුදයක් තිබූ බවට සාක්ෂි ඉදිරිපත් කළද එය සාර්ථක නොවූ බවද පැහැදිලි වන්නේ සේවකයන්ගේ අඩු කිරීමක් හෝ විශ්‍රාම ගැන්වීමක් හෝ සේවය අවසන් කිරීමේ අංශය වෙත සේවකයන් අඩු කිරීම සම්බන්ධයෙන් ඉල්ලීමක්වත් කර නොමැති බවට සනාථවීමෙනි. තව ද, අවසාන වශයෙන් නිකුත් කර තිබූ 2009/003 දරන චක්‍රලේඛය අනුව විශ්‍රාම වයස අවුරුදු 55 දක්වා අඩු කිරීමට භාජනය කරනු ලැබුවේ ලංකා බැංකු සේවක සංගමය සමග කරන ලද සාකච්ඡාවේ ප්‍රතිඵලය මත බවට සාක්ෂි මෙහෙයුවද අනිකුත් වෘත්තීය සමිතිය වන සෙලාන් බැංකු සේවක සංගමය සමග සාකච්ඡා කල බවට සනාථ කිරීමට නොහැකි වී ඇති බවද සැලකිල්ලට ගතිමි.

තව ද, මෙම ඉල්ලුම්කරුවන් තමන්ට අවුරුදු 58 දක්වා සේවය කිරීමට ඉඩ ඇති බවට අපේක්ෂාවෙන් සිටි බවත්, අවසාන වශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය මගින් ද අවුරුදු 57 දක්වා වත් සේවය කිරීමට හැකියාව ඇතිවේය යන අපේක්ෂාව හා බලාපොරොත්තුව තිබූ බවද ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛන මගින් තහවුරු වී ඇති බවද සැලකිල්ලට ගතිමි.

මෙම සියලුම සාක්ෂිවලින් පෙනී යන්නේ දෙවැනි පාර්ශවය වන බැංකුව සේවකයන්ගේ විශ්‍රාම යන වයස සම්බන්ධයෙන් මුල් අවස්ථාවලදී සේවකයන්ගේ ද එකඟතාවය මත විශ්‍රාම යාමේ වයස අවුරුදු 58 දක්වා වැඩිකර ඇති බවද, තවද, SCL 2001/10 චක්‍රලේඛයෙහි සඳහන් විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 දක්වා වූ කරුණ සම්බන්ධයෙන් චක්‍රලේඛය අවලංගු කිරීමක් මේ දක්වා සිදුව නොමැති බව ද පෙනී යයි. ඒ අනුව මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන්ගේ අවුරුදු 58 දක්වා වූ විශ්‍රාම යාමේ වයස සම්බන්ධයෙන් තිබූ අපේක්ෂාවන් එලෙසම පැවති බවද පෙනී යයි. එමෙන්ම දෙවැනි පාර්ශ්වය වන බැංකුව විසින් මුලින් සේවකයන්ගේ විශ්‍රාම වයස අවුරුදු 58 දක්වා වැඩිකර පසුව හිතුවක්කාරී ලෙස ඒකපාර්ශිකව විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 කිරීම නීති විරෝධී සහ නීත්‍යානුකූල නොවන අතර රජයේ සේවකයන්ට බලපාන චක්‍රලේඛයක් පදනම් කර ගනිමින් එය සිදු කිරීම පදනම් විරහිත අසාධාරණ සහ අයුක්ති සහගත එකක් බව තීරණය කරමි. තවද අදාළ චක්‍රලේඛයෙහි සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කුමක්ද යන්නවත් සඳහන් නොවන බවද මෙහිදී සැලකිල්ලට ගතිමි.

දෙවැනි පාර්ශවය වන බැංකුව විසින් නිකුත් කරන ලද "ඉ 1" දරන චක්‍රලේඛයට අනුව සේවකයන්ගේ පත්වීම ලිපියෙහි ඇති 13 වැනි ඡේදය සංශෝධනය කර ඇති බැවින් එයින් පසුව පත්වීම් ලිපියේ එම ඡේදයට නෛතික වලංගුතාවයක් ඇති නොවේ. ඒ අනුව පත්වීම් ලිපියේ 13 වැනි ඡේදය යටතේ සේවකයන් විශ්‍රාම ගැන්වූවාය යනුවෙන් සඳහන් කර ඇති කරුණට කිසිදු පදනමක් නොමැති බව පෙනී යයි. ඊට අමතරව, සේවකයන්ගේ සේවය දීර්ඝ කිරීමේදී "X4" චක්‍රලේඛයේ "b" කොටසේ දැක්වෙන පරිදි ඔවුන්ගේ හැකියාවන් දක්ෂතාවයන් පිළිබඳ ඇගයීමක් සිදුකර එම සේවා දිගුව ලබාදෙනවාය යන්න ද දෙවැනි පාර්ශවය විසින්ම බිඳ හෙලා ඇත. කිසිදු අවස්ථාවක එසේ ඇගයීමක් සිදු කරන ලද බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට දෙවැනි පාර්ශවය අපොහොසත්වී ඇත. ඒ අනුව පෙනී යන්නේ දෙවැනි පාර්ශවය විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ විවිධ අවස්ථාවලදී ඔවුන් විසින්ම ඊට පටහැනිව කටයුතු කිරීමෙන් සේවකයන්ගේ අපේක්ෂාවන් බිඳ හෙලීමට දෙවැනි පාර්ශවය කටයුතු කර ඇති බවයි. තව ද, දෙවැනි පාර්ශවයේ සාක්ෂිකරුවන් මගින් හෝ පළමු පාර්ශවයේ සාක්ෂිකරුවන්ගේ මූලික සාක්ෂි හරස් ප්‍රශ්නවලට භාජනය කිරීම මගින් හෝ තමන් සිදුකරන ලද අවුරුදු 55න් විශ්‍රාම ගැන්වීම සාධාරණීකරණය කිරීමට හෝ නීත්‍යානුකූල බව තහවුරු කිරීමට සිදුකර නොමැති බවද තීරණය කරමි.

තව ද, දෙවැනි පාර්ශවීය බැංකුව විසින් ගෙන එන ලද නීති තර්කයක් ලෙස මෙම ආරවුල ප්‍රථමයෙන් කම්කරු විනිශ්චය සභාවක් වෙත හෝ සේවය අවසන් කිරීමේ අංශයට යොමු නොකරමින් වසර 2 1/2කට පමණ පසු කම්කරු දෙපාර්තමේන්තුවට දැන්වීමෙන් කාලවරෝධයට ලක්වී ඇති බවත්, එය නීතියට පටහැනි බවටත් ඉදිරිපත් කරන ලද විරෝධතාවය පිළිගත නොහැක්කේ සේවකයකුට ආරවුලක් සම්බන්ධයෙන් ලබා ගත හැකි ප්‍රතිකර්ම සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක පළමුව කළ යුත්තේ කුමක්ද යන්න නීතියේ සඳහන් කර නොමැති බවත්, කාර්මික ආරවුල් පනත යටතේ හෝ සේවය අවසන් කිරීමේ පනත යටතේ වන ප්‍රතිපාදනවලින් කුමක් හෝ තෝරා ගැනීමේ පූර්ණ අයිතිය ඔවුන් සතු බව යන්න හා කාර්මික ආරවුල් පනත යටතේ ආරවුලක් බේරුම්කරුවකු වෙත යොමු කිරීම සම්බන්ධයෙන් කාල රාමුවක් සඳහන් කර නොමැති බව යන්න සලකා බලා එම කරුණ ද ප්‍රතික්ෂේප වන බව මෙහිදී සැලකිල්ලට ගතිමි.

ඒ අනුව මෙම බේරුම්කරණ යොමුවේ සඳහන් සේවකයන් 51 දෙනා අතරින් සේවකයන් තිදෙනෙකු වන ලේඛනයේ අංක 8හි සඳහන් එම්. ඒ. එස්. සී. පෙරේරා, අංක 22 හි සඳහන් ආර්. එන්. ආර්. නාගහවත්ත සහ අංක 44 සඳහන් එම්. ඒ. රංජිත් ජයවර්ධන යන සේවකයන් හැර ඉතිරි සේවකයන් 48 දෙනෙකු සම්බන්ධයෙන් පහත ප්‍රදානය ලබා දෙමි. මෙම ප්‍රදානය ලබා දීමේදී පළමු හා දෙවන පාර්ශවයන්ගේ එකඟතාවයන් මත ඉදිරිපත් කරන ලද 'Z' ලේඛන පදනම කර ගනිමින් කටයුතු කළ බවද සඳහන් කරමි.

### ප්‍රදානය

ඉහත කරුණු සියල්ලම සලකා බලා මෙහි පහත ලේඛනයේ නම් සඳහන් සේවකයන්ට ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් මුදල ගෙවන ලෙසට (දෙපාර්ශවයේම එකගතාවයෙන් ඉදිරිපත් කරන ලද Z ලේඛනයේ 7 තීරුවට අනුව) දෙවන පාර්ශවයට නියම කරමි. එම සේවකයන් 48 දෙනාට ගෙවිය යුතු මුදලේ එකතුව වන රුපියල් දාසයකෝටි පනස් දෙලක්ෂ දහතර දහස් නවසිය පනහක (රු. 165,214,950) මුදල පළමු පාර්ශවයේ සේවකයන්ට ලබා ගත හැකි වන පරිදි මෙම ප්‍රදනය ගැසට් පත්‍රයේ පළ කළ දින සිට මසක්

ඇතුළත සහකාර කම්කරු කොමසාරිස්, නැගෙනහිර කොළඹ වෙත තැන්පත් කරන ලෙසට තවදුරටත් නියම කරමි. තවද, එම Z ලේඛනයේ නම් සඳහන්ව ඇති හා යොමුවේ නම් සඳහන් අංක 08 දරන එම්. ඒ. එස්. සී. පෙරේරා, අංක 22 දරන ආර්. එන්. ආර්. නාගහවත්ත සහ අංක 44 දරන එම්. ඒ. රංජිත් ඩබ්. ජයවර්ධන යන සේවකයන් තිදෙනා සම්බන්ධයෙන් ප්‍රදනයක් නොකරමි. (අංක 8 හා 44 ආරවුලෙන් ඉවත් වී ඇති අතර අංක 22 මියගොස් ඇත.)

තව ද, සේවක අර්ථසාධක අරමුදල් ඇතුළු ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් ප්‍රදනයක් නොකරන අතර ඒ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදනය බාධාවක් නොවන බව ද සඳහන් කරමි.

මෙම ප්‍රදනය යුක්ති සහගත සහ සාධාරණ බවට තීරණය කරමි.

**නාමලේඛනය**

| | නම | | ගෙවිය යුතු මුදල රු. ශත |
|---|---|---|---|
| 01. | එම්. අයි. එම්. රිස්වි මහතා 671 | - | 4,053,900.00 |
| 02. | එච්. සී. චන්ද්‍රසිරි මහතා 89 | - | 2,821,230.00 |
| 03. | ඒ. ඒ. එම්. හේමිකා ෆොන්සේකා මිය 3716 | - | 3,210,840.00 |
| 04. | ටී. ඒ. කාසිම් මහතා 688 | - | 1,387,440.00 |
| 05. | ඩී. එල්. සී. ගුණසේකර මහතා 2570 | - | 2,507,400.00 |
| 06. | ඒ. යූ. ඒ. ඊ. එම්. අබේසේකර මහතා 2780 | - | 1,737,300.00 |
| 07. | ටී. එම්. එම්. රෝඩ්‍රිගු මිය 208 | - | 2,371,320.00 |
| 08. | එම්. ඒ. එස්. සී. පෙරේරා මහතා 675 | - | - |
| 09. | ඒ. ආර්. එම්. හනන් මහතා 58 | - | 6,210,000.00 |
| 10. | එන්. ඒ. එම්. ඊ. එස්. කුරේරා මිය 2783 | - | 2,375,280.00 |
| 11. | පී. එම්. පොන්වීර මිය 1391 | - | 3,055,500.00 |
| 12. | එන්. සමරසේකර මහතා 161 | - | 4,875,120.00 |
| 13. | දුලිප් සී. රණසිංහ මහතා 912 | - | 4,623,000.00 |
| 14. | තුසිල් ද සිල්වා එදිරිසූරිය මහතා 970 | - | 3,846,000.00 |
| 15. | එම්. එච්. එම්. ඉක්බාල් මහතා 700 | - | 765,720.00 |
| 16. | ආර්. පී. කේ. ලියනාරච්චි මහතා 3700 | - | 2,503,800.00 |
| 17. | එච්. එස්. ආර්. සමරසිංහ මහතා 861 | - | 3,840,840.00 |
| 18. | ටී. සුබමුරලිදරන් මහතා 31 | - | 8,164,440.00 |
| 19. | ආර්. එල්. එම්. ඩබ්. දිසානායක මහතා 25 | - | 5,496,000.00 |
| 20. | එම්. කේ. ප්‍රේමතිලක මහතා 163 | - | 8,853,840.00 |
| 21. | ජී. ජී. අනුර සේරසිංහ මහතා 3934 (ඩී. ජී. අනුර සේනසිංහ) | - | 3,440,880.00 |
| 22. | ආර්. එන්. ආර්. නාගහවත්ත මහතා 2150 | - | - |
| 23. | ඩබ්. එල්. ජී. හක්මනආරච්චි මිය 158 | - | 2,073,600.00 |
| 24. | බී. ටී. ජේ. ප්‍රනාන්දු මහතා 3098 | - | 2,961,900.00 |
| 25. | රංජිත් පී. හල්වල මහතා 225 | - | 4,841,640.00 |
| 26. | සී. ඒ. පී. ග්‍රේටිං ප්‍රනාන්දු මහතා 4521 | - | 447,240.00 |
| 27. | ජේ. ඒ. අජිත් පෙරේරා මහතා 224 (ජේ. ඒ. ආර්. පෙරේරා) | - | 5,214,240.00 |
| 28. | බී. නීල් සී. ප්‍රනාන්දු මහතා 391 | - | 4,031,040.00 |
| 29. | ඩී. අයිවන් ජයසූරිය මහතා 1815 | - | 5,720,760.00 |
| 30. | එම්. අයි. ජී. ගාමිණී සූරියබණ්ඩාර මහතා 0553 | - | 4,587,840.00 |
| 31. | කේ. නිහාල් ද සිල්වා මහතා 1188 | - | 3,116,400.00 |
| 32. | කේ. ඒ. ජේ. සී. බණ්ඩාර මිය 3367 | - | 3,398,400.00 |
| 33. | රොහාන් අයි. මාටින් මහතා 2273 | - | 3,739,200.00 |
| 34. | එම්. වාෂිර් ඩේන් මහතා 425 | - | 5,988,960.00 |
| 35. | වී. කෙයිලානන්දන් මහතා 1286 | - | 1,812,240.00 |
| 36. | ඩබ්. එම්. වී. පෙරේරා මහතා 178 | - | 4,317,360.00 |
| 37. | ඊ. ආර්. එම්. එම්. වීරසූරිය මිය 229 | - | 3,319,440.00 |
| 38. | ඊ. කේ. එස්. ඩී. ආරියදස මහතා 3910 | - | 3,990,600.00 |
| 39. | කාන්ති වික්‍රමතිලක මිය 4796 | - | 2,109,960.00 |
| 40. | කමණී ජයසිංහ මිය 1523 | - | 1,517,400.00 |
| 41. | ජේ. එම්. ඩී. ඩී. එල්. ජයසිංහ මහතා 2232 | - | 3,411,000.00 |
| 42. | එස්. එස්. ඩබ්. එම්. ජී. කොබ්බෑවල මහතා 4411 | - | 2,942,280.00 |
| 43. | එම්. සනත් රූපසිංහ මහතා 3888 | - | 4,061,160.00 |
| 44. | එම්. ඒ. රංජිත් ඩබ්. ජයවර්ධන මහතා 1765 | - | - |
| 45. | ඩී. එම්. කුමාරරත්න මහතා 4111 | - | 2,430,720.00 |
| 46. | නියෝමාල් ඒ. සුරවීර මහතා 334 | - | 3,209,400.00 |
| 47. | ඩබ්. ජී. චන්ද්‍රා කරුණාරත්න මිය 405 | - | 2,398,320.00 |
| 48. | සී. ජේ. ඩී. අබේගුණවර්ධන මිය 4584 | - | 2,028,600.00 |
| 49. | එච්. මැණික් එස්. ප්‍රනාන්දු මිය 4464 | - | 2,096,280.00 |
| 50. | ප්‍රේමලාල් නාරාහේන්ගොඩ මහතා 3824 (ප්‍රේමලාල් නාරංගොඩ) | - | 1,783,800.00 |
| 51. | ඇන්ජලා පුල්ලනායගම් මිය 2784 | - | 1,525,320.00 |
| | එකතුව | - | 165,214,950.00 |

2020 මාර්තු මස 17 වැනි දින.

09 - 480

---

*මගේ අංකය :* IR/10/17/2006.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2007.06.28 දිනැති හා අංක 1503/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ

ප්‍රසිද්ධ කරන ලද 2007.05.25 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මීගමුව, කිඹුලාපිටිය, සිරිසෙවන හි පදිංචි ඩී. බී. සිරිවර්ධන මිය, කළගෙඩිහේන, බෝගමුව, අංක 132හි පදිංචි ඩී. ඒ. එන්. දිසානායක මයා සහ කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 හි පිහිටි සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.07.07 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 අගෝස්තු මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණය**

(1) ඩී. බී. සිරිවර්ධන,
සිරිසෙවන,
කිඹුලාපිටිය,
මීගමුව.

නඩු අංකය : A 3216
IR/10/17/2006

(2) ඩී. ඒ. එන්. දිසානායක,
අංක 132,
බෝගමුව,
කළගෙඩිහේන.

*පළමු පාර්ශ්වය (ඉල්ලුම්කරුවෝ)*

සහ

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,
අංක 21,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**තීන්දුව**

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත්වල 131 පරිච්ඡේදයේ 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය වන 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය ප්‍රකාරව යොමු කරන ලද ඉහත අංක දරන අයදුම්පතට විෂය වූ කාරණය, ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම අපගේ බේරුම්කරණ පටිපාටියේ මුඛ්‍ය අරමුණ විය.

එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කළ ඩී. බී. සිරිවර්ධන මහත්මියට හා ඩී. ඒ. එන්. දිසානායක මහතාට 2004.06.16 වැනි දින සිට සේවයට වාර්තා කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයන් සැළකිල්ලට නොගෙන එම සංස්ථාව විසින් ඔවුන් සිය කැමැත්තෙන් සේවය අතහැර ගිය සේ සැලකීම යුක්ති සහගත නොවේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න" වේ.

**පසුබිම**

ඉහත යොමු කිරීමට අදළව මුල් විස්තර ප්‍රකාශයක් ඉල්ලුම්කාර පාර්ශවය (පළමු පාර්ශවය) විසින් 2017.07.12 දතමින් ඉදිරිපත් කර ඇති අතර, එහි දී අවශ්‍ය ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව සේවා යෝජක දෙවන පාර්ශ්වය තම ප්‍රකාශය 2007.11.29 දතමින් ගොනු කරන ලදී. ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය තම ප්‍රකාශයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අදළ කර ගත හැකි කිසිදු ලේඛනයක් අමුණා ඉදිරිපත් කර නො තිබුණු අතර සේවායෝජක දෙවන පාර්ශවය තම ප්‍රකාශයට අමුණා. X, X[1], Y, Y[1] වශයෙන් ලේඛන හතරක් ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය තම ප්‍රතිප්‍රකාශය ද, ඉන් අනතුරුව සේවායෝජක දෙවැනි පාර්ශ්වය තම ප්‍රතිප්‍රකාශය ද ගොනු කරන ලදී. එසේ ප්‍රකාශ, ප්‍රතිප්‍රකාශ ගොනු කර තිබුණේ වී නමුදු පාර්ශ්වයන් ගේ නොයෙකුත් ඉල්ලීම් හේතුවෙන් කල් දැමීමට සිදු වූ පරීක්ෂණය 2009.06.08 වැනි දින ආරම්භ කිරීමට සූදනම් වූ අවස්ථාවේදී සේවායෝජක දෙවන පාර්ශ්වය විසින් කරන ලද ඉල්ලීමක් සලකා බැලීමට බේරුම්කාර මට සිදු විය. එකී ඉල්ලීම වූයේ වගඋත්තරකාර ආයතනය පරිවර්තන කාල සීමාවක පසු වන බැවින් ද. අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර ඇති බැවින් ද, නව සභාපතිවරයකු සහ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමට නියමිත බැවින් ද, නීතිමය වශයෙන් බාධාවක් පවතින හෙයින් මෙම අයදුම්පත සුදුසු අවස්ථාවක දී ඉදිරියට ගැනීමට ඉඩතබමින් බහා තබන ලෙස යි. සේවායෝජක පාර්ශවයේ එකී ඉල්ලීමට විරෝධතාවක් ඉල්ලුම්කාර පාර්ශවයෙන් පළ නොවූ අතර ඉදිරි ක්‍රියාමාර්ගයක් සුදුසු අවස්ථාවක දී ගැනීමට පාර්ශවයන් එකඟ වූ හෙයින් එකී තත්ත්වයන්ට යටත් ව අයදුම්පත පිළිබඳව පරීක්ෂණය බහා තැබීමට තීරණය කළෙමි.

**නැවත පරීක්ෂණය සක්‍රීය කරන ලෙස ඉල්ලා සිටීම සහ පරීක්ෂණය ආරම්භ වීම.**

ඉහතින් සඳහන් කළ ආකාරයට මෙම පරීක්ෂණය මුල් අවස්ථාවේ බහා තබන ලද්දේ 2009.06.08 වැනි දින ය. මෙම පරීක්ෂණය සක්‍රීය කර පවත්වා ගෙනයාම සඳහා පළමු පාර්ශ්වයේ දෙවන ඉල්ලුම්කරු විසින් 2016.08.25 දිනැතිව ඉල්ලීමක් කරන ලද අතර, ඒ අනුව සේවායෝජක දෙවන පාර්ශ්වය වෙත නොතීසි යවා අයදුම්පත 2016.10.24 වැනි දින කැඳවීමට දින නියම කරන ලදී. එදින ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය ද, සේවායෝජක පාර්ශ්වය වෙනුවෙන් නියෝජිතයකු සමග නීතිඥවරයා ද පෙනී සිටි අතර, සේවායෝජක පාර්ශ්වයේ නීතිඥවරයා 2009 වර්ෂයේ බහා තබන ලද මෙම පරීක්ෂණය නැවත සක්‍රීය කර පවත්වා ගෙන යාමට කරන මෙම ඉල්ලීම වසර හයකටත් අධික කාලයකට පසුව කරනු ලබන්නන් වන බැවින් ආයතනය ප්‍රායෝගික දුෂ්කරතාවකට පත් වන එකී ඉල්ලීම ඉවත් කරන ලෙස ඉල්ලා සිටියේ ය. කෙසේ වුවද තීරණයක් ගැනීමට ඉල්ලුම්කාර පාර්ශ්වයේ ඉල්ලීම විධිමත් ලෙස වෙන වෙනම දිවුරුම් ප්‍රකාශ මගින් ලබාදෙන ලෙස නියෝග කරන ලදී. ඉල්ලුම්කාර

පළමු පාර්ශ්වය විසින් ද. සේවායෝජක දෙවන පාර්ශවය විසින් ද දිවුරුම් ප්‍රකාශ මගින් ප්‍රකාශ ගොනු කිරීමෙන් ද දෙපාර්ශ්වය විසින්ම ප්‍රතිප්‍රකාශ ගොනු කිරීමෙන්ද අනතුරුව සියලු කාරණා සළකා බලා බේරුම්කරණ ක්‍රියාවලිය නැවත පරීක්ෂණය සඳහා ගැනීමට නියෝග කරන ලදී. (නියෝගය 2017.11.24)

ඉහත නියෝගය ප්‍රකාරව පරීක්ෂණය නැවත ඇරඹුණු 2018.02.22 වැනි දින ඉල්ලුම්කරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ මත සේවායෝජක පාර්ශ්වය වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම ද, ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් නැවත ප්‍රශ්න කිරීම් ද සිදු විය.

එසේම පළමු පාර්ශ්වයේ දෙවැනි ඉල්ලුම්කරුගේ සාක්ෂිය ද ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීම සහ නැවත ප්‍රශ්න කිරීම ද සිදු විය. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් දෙදෙනකු කැඳවා තිබූ අතර, ඒවා වාචික සාක්ෂිවලට පමණක් සීමා විය. එක් තැනැත්තියක පළමු පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කාරියගේ ඥාතිවරයක වූ අතර, දෙවන සාක්ෂිකරු සේවායෝජක ආයතනයේ ප්‍රබල වෘත්තීය සමිතියක සභාපතිවරයකු ලෙස කටයුතු කළ තැනැත්තෙක් වූයේ ය.

සේවා යෝජක පාර්ශ්වය විසින් 2018.11.30 දිනැතිව ගොනු කරන ලද පිළිතුරු ප්‍රකාශය මත හරස් ප්‍රශ්න ඇසීම ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් 2019.01.09 වැනි දින ආරම්භ කරන ලදී. එම පිළිතුරු ප්‍රකාශය සමග සහ සාක්ෂිකරු වූ පිරිස් සබඳතා කළමනාකරු මගින් $R^1$ සිට R17 දක්වා වූ ලේඛන සළකුණු කර ඉදිරිපත් කරන ලදී.

**විසඳිය යුතු ප්‍රශ්න**

මෙම අයදුම්පත සම්බන්ධ කාරණය වෙනත් ඒ ආකාර වූ යොමු කිරීමක් සම්බන්ධ කාරණයකට වඩා වෙනස් ආකාරයකට විකාශය වූවකි. එය මුල් අවස්ථාව සහ දෙවැනි අවස්ථාව වශයෙන් බෙදිය හැකි ය. මුල් අවස්ථාවේ සේවායෝජක පාර්ශ්වය විසින් මතු කරන ලද නෛතික විරෝධතාවක් හේතුවෙන් සහ ඉල්ලුම්කාර පාර්ශ්වය ඊට අනුකූලතාව දැක්වීමේ හේතුවෙන් පරීක්ෂණය ලත් තැන ම බහා තැබිණි. (Laid by), එහි දී බේරුම්කරණය වටහා ගත්තේ මෙම පරීක්ෂණයට යොමු කරන ලද ප්‍රස්තුත කාරණය සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර සමථයක් ඇති වීමේ සම්භාව්‍යතාවක් නොමැති බව ය.

දෙවැනි අවස්ථාවම බේරුම්කරණය යොමු වන්නේ තවත් අවුරුදු හතකට අඩු වැඩි කාලයකට පසුව ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ලිඛිත ඉල්ලීමක් මාර්ගයෙන් නැවත පරීක්ෂණය සක්‍රීය කරවා ගැනීම සඳහා වූ අවශ්‍යතාව සම්බන්ධයෙන් කරුණු දැක්වීමෙන් පසුව ය.

නැවත පරීක්ෂණය ආරම්භ වීමෙන් පසුව ඉදිරිපත් වූ සාක්ෂි සහ ලේඛන සලකා බැලීමේ දී ප්‍රස්තුත කාරණය වූ 'එම සංස්ථාව (සේවායෝජක) විසින් ඔවුන් (ඉල්ලුම්කරුවන්) සිය කැමැත්තෙන් සේවය අත්හැර ගිය සේ සැළකීම යුක්ති සහගත ද' යන්න තීරණය කිරීම අපගේ වගකීම විය.

මෙහිදී පහත සංක්ෂේපයෙන් සඳහන් කරන කාරණා විමර්ශනයට පාත්‍ර කර ගත යුතු බව අදහස් කළෙමි.

1. ඉල්ලුම්කාරයන් 2004.06.16 වැනි දින පෞද්ගලික හේතුවක් මත සේවයට පැමිණිය නොහැකි බවට නිවාඩු අනුමත කර ගෙන තිබුණේ ද ?

2. ඉල්ලුම්කාරයන් 2006.06.17 සහ 2004.06.18 වැනි දෙදින සඳහා පෞද්ගලික හේතූන් සඳහා යැයි කියමින් විදුලි පණිවුඩ මගින් නිවාඩු ඉල්ලා තිබුණේ ද ?

3. එකී 2004.06.18 දිනයෙන් පසුව 2004.07.05 වැනි දින දක්වා ඉල්ලුම්කාරයින් තමන්ට සේවයට වාර්තා කිරීමට අපහසු වන බවට කිසිදු දැනුම්දීමක් (ලිඛිත හෝ වාචික) ආයතනය වෙත කර නොමැත්තේ ද ?

4. වර්ෂ 2004.07.08 වැනි දින එකී ඉල්ලුම්කාරයින් සේවයට වාර්තා නොකළහොත් ස්වේච්ඡාවෙන් සේවය අත්හැර ගිය ලෙස සළකා කටයුතු කරන බවට දන්වා සේවායෝජක පාර්ශ්වය විසින් 2004.07.05 දිනැති ව නිකුත් කරන ලිපි මගින් ඉල්ලුම්කාරයිනට (පිළිවෙලින් $R^3$ සහ $R^9$) ලබා දී තිබූ කාලය ප්‍රමාණවත් වේ ද ?

5. එකී $R^3$ සහ $R^9$ වශයෙන් සළකුණු කරන ලද ලිපි මගින් එනම්, පිළිවෙලින් ඉල්ලුම්කාරයින් වෙත ස්වේච්ඡාවෙන් සේවය හැර ගිය සේ සළකන බවට සේවායෝජක ආයතනය විසින් යවන ලද 2004.07.05 දිනැති ලිපිවලට ප්‍රතිචාරයක් 2004.07.11 වැනි දින වන විටත් ලැබී නොතිබුණු හෙයින් එකී ලිපියම (පිළිවෙලින් $R^{11}$ සහ $R^{17}$) 2004.07.12 දතමින් නැවතත් ඉල්ලුම්කාරයින් වෙත යවා ඇත් ද ?

6. ඉහත කී ලිපි අතරින් පළමුව යවන ලදැයි කී 2004.07.05 දිනැති $R^3$ සහ $R^9$ දරන ලිපිවලට පිළිතුරු ලිපියක් තම නීතිඥවරිය මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලක් යවා (පිළිවෙලින් $R^2$ සහ $R^{10}$) එහි පිටපත් 2004.07.08 වැනි දින ඉල්ලුම්කාරයින් වෙනුවෙන් ආයතනය වෙත අතින්ම බාර දී තිබුණේ ද ?

7. කෙසේ වෙතත් එකී $R^2$ සහ $R^{10}$ ලෙස සළකුණු කර ඇති ලිපි මගින් හෙළිදරව් කරන තෙක් ඉල්ලුම්කාරයින් 2004.06.16 වැනි දින සිට 2004.07.08 වැනි දින දක්වාම කිසියම් චෝදනාවක් මත අත්අඩංගුව පත් වී රක්ෂිත බන්ධනාගාරගත කර සිටින බැව් සේවායෝජක ආයතනය වෙත දැනුම් දීමෙන් වැළකී සිට ඇද්ද ?

8. යොමු කරන ලද කාර්මික ආරවුල පිළිබඳ මුල් අවස්ථාවේ පරීක්ෂණය ආරම්භ කර බහා තැබීමට නියෝග කරන ලද 2007.06.08 වැනි දින වන විට පළමු ඉල්ලුම්කාරියත්, දෙවනුව සක්‍රීය කරන ලද පරීක්ෂණය ආරම්භ කරනු ලැබූ 2018.02.22 වැනි දින වන විට දෙවන ඉල්ලුම්කරුවන් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ඉල්ලා බාර ගෙන තිබුණේ ද සහ එසේ ලබාගැනීමේ දී සංස්ථාවේ සේවයෙන් ඉවත් වී ඇති බව ප්‍රකාශ කර තිබුණේ ද?

ඉහතින් අංක 01 සිට 08 දක්වා සංක්ෂේපයෙන් දක්වන ලද කාරණා, මෙම විමර්ශනය පිළිබඳව තීරණය කිරීම කෙරෙහි මවිසින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ කාරණා වෙයි. සමස්තයක් වශයෙන් සාක්ෂි සහ ලේඛන ඇසුරු කර ගෙන විමසීමේදී ඉල්ලුම්කාර පාර්ශ්වයට අවාසිදයක ලෙස බලපාන බව සඳහන් කළ යුතුය. සේවයට පැමිණීමට යම් අපහසුවක් හදිසියේ ඇති වූ අවස්ථාවක දී විනය රෙගුලාසි සහ නීතිමය පැත්තෙන් මෙහි සේවක ඉල්ලුම්කාරයින් ක්‍රියා කර ඇති ආකාරය අසතුටුදයකය. මෙහි දී කාර්මික ආරාවුලක කොටස්කාරයින් වෙමින් සහනයක් ඉල්ලා සිටීමට ඇති අයිතිය තම යුතුකම් සහ වගකීම් ඉටු කිරීමේ අඩුපාඩු හේතුවෙන් එසේ නැති නම් චේතනාන්විතවම කඩකර තිබීම මත අහිමිකර ගෙන ඇති බව හොඳින්ම නිරීක්ෂණය විය. සේවක ඉල්ලුම්කාරයින් දෙදෙනා පොලිස් අත්අඩංගුවට පත් වීමේ කාරණය තම සේවායෝජක ආයතනයට හෙළිවීම වළක්වා ගැනීම සඳහා ගන්නා ලද උත්සාහය මගින් ඔවුන් රාජ්‍ය සේවය තුළ පවත්වා ගෙන යා යුතු විශ්වසනීයත්වය කෙළෙසා ගෙන ඇතිවා පමණක් නොව එසේ කිරීමෙන් රාජ්‍ය සේවය නොමඟ යැවීමට හැකි වේ ය යන අන්ධ විශ්වාසයක් ද ප්‍රකට කර ඇති බව නිරීක්ෂණය විය.

විශේෂයෙන්ම ඉහත අංක 03 කෙරෙහි අවධානය යොමු කිරීමේදී 2004.07.05 දිනැතිව ".............. ඉල්ලුම්කාරයන් 2004.07.08 වැනි දින වන විට සේවයට වාර්තා නොකළහොත් ස්වේච්ඡාවෙන් සේවය අත්හැර ගියා ලෙස සලකා කටයුතු කරන බවට කරන ලද දැන්වීම" දීර්ඝ වූ කාලයක් ලබා දෙමින් නිකුත් කළ යුත්තක් නොවන බව මම තීරණය කරමි. වර්ෂ 2004.06.18 වැනි දින සිට වර්ෂ 2004.07.05 වැනි දින දක්වා කිසිදු දැනුම් දීමක් පිළිගත හැකි ආකාරයට තම සේවායෝජක ආයතනය වෙත නොකරමින් අත්තනෝමතික ලෙස කිසිදු බයකින් තොරව කටයුතු කළ සේවක ඉල්ලුම්කාරයින් දෙදෙනා වෙත කරන ලද දැනුම්දීම පමණක් ප්‍රමාණවත් වන බවට නිගමනය කරමි.

තවද ඉහත අංක 8 යටතේ සඳහන් පරිදි මෙම කාර්මික ආරාවුල පිළිබඳ මුල් අවස්ථාවේ පරීක්ෂණය ආරම්භ කර බහා තැබීමට නියෝග කරන ලද 2009.06.08 වැනි දින වන විට පළමු ඉල්ලුම්කාරියත්, දෙවනුව සක්‍රීය කරන ලද පරීක්ෂණය ආරම්භ කරනු ලැබූ 2008.02.22 වැනි දින වන විට දෙවන ඉල්ලුම්කරුත් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ඉල්ලා බාර ගෙන තිබූ බවත් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අයදුම්පත්වල තමන් සංස්ථා සේවයෙන් කැමැත්තෙන් ඉවත් වූ බවට ප්‍රකාශ කොට අත්සන් තබා තිබීම බරපතල පිළිගැනීමක් ලෙස බාර ගත යුතුය.

**ප්‍රදනය ඃ**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත සහ සාධාරණ නිගමනයක් වශයෙන් කිසිදු ප්‍රදනයක් කිරීමට හේතුවක් නොපෙනෙන බැවින් එවැනි නිගමනයකට නොඑළැඹෙමින් මෙම අයදුම්පත් වෙන් වෙන්ම ප්‍රතික්ෂේප කරමි.

ජයන්ත ද සිල්වා,
බේරුම්කරු.

වර්ෂ 2020ක් වූ ජූලි මස 07 වැනි දින,

09 - 481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.